# ජාතික රාජ්‍ය සභාවේ 1978 අංක 23

# දරන නියෝජ්‍ය රෙජිස්ට්‍රාර් ජනරාල්වරයා (පත් කිරීමේ) පනත

[සහතිකය සටහන් කළේ 1978 ජූලි මස 3 වන දින]

ආණ්ඩුවේ නියමය පරිදි මුද්‍රණය කරන ලදී

(1978 ජූලි මස 07 වැනි දින ශ්‍රී ලංකා ජනරජයේ ගැසට් පත්‍රයේ II වැනි කොටසේ
අතිරේකයක් වශයෙන් පළ කරන ලදී)

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී

කොළඹ රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් මිළ දී ගත හැක

මිල : ශත 15 යි    තැපැල් ගාස්තුව : ශත 15 යි

ජාතික රාජ්‍ය සභාවේ 1978 අංක 23 දරන නියෝජ්‍ය රෙජිස්ට්‍රාර් ජනරාල්වරයා (පත් කිරීමේ) පනත

[සහතිකය සටහන් කළේ 1978 ජූලි මස 3 වන දින]

එල්. ඩී.—ඕ. 41/76.

නියෝජ්‍ය රෙජිස්ට්‍රාර් ජනරාල්වරයකු පත් කිරීම සඳහා විධිවිධාන සැලැස්වීම පිණිස වූ පනතකි.

ශ්‍රී ලංකා ජනරජයේ ජාතික රාජ්‍ය සභාව විසින් මෙසේ පනවනු ලැබේ :—

**ලුහුඩු නාමය.**

1. මේ පනත ජාතික රාජ්‍ය සභාවේ 1978 අංක 23 දරන නියෝජ්‍ය රෙජිස්ට්‍රාර් ජනරාල්වරයා (පත් කිරීමේ) පනත යනුවෙන් හඳුන්වනු ලැබේ.

**නියෝජ්‍ය රෙජිස්ට්‍රාර් ජනරාල්වරයා පත් කිරීම සහ ඔහුගේ කාර්ය.**

2. (1) නියෝජ්‍ය රෙජිස්ට්‍රාර් ජනරාල්වරයකු වීමට හෝ නියෝජ්‍ය රෙජිස්ට්‍රාර් ජනරාල්වරයකු වශයෙන් ක්‍රියා කිරීමට සුදුසු හා නිසි තැනැත්තකු පත් කරනු ලැබිය හැකි ය.

(2) යම් ලිඛිත නීතියකින් හෝ යම් ලිඛිත නීතියක් යටතේ රෙජිස්ට්‍රාර් ජනරාල්වරයා වෙත පවරනු ලැබූ හෝ නියම කරනු ලැබූ යම් බලයක්, කාර්යයක් හෝ කටයුත්තක් රෙජිස්ට්‍රාර් ජනරාල්වරයාගේ අධිකාරයට හා පාලනයට යටත්ව නියෝජ්‍ය රෙජිස්ට්‍රාර් ජනරාල්වරයා විසින් ක්‍රියාත්මක කිරීම, ඉටු කිරීම හෝ කිරීම කළ හැකි ය.

**අර්ථ නිරූපණය.**

3. මේ පනතෙහි—

"රෙජිස්ට්‍රාර් ජනරාල්වරයා" යන්නට—

(අ) (110 වන අධිකාරය වූ) උප්පැන්න හා මරණ ලියාපදිංචි කිරීමේ පනතේ 2 වන වගන්තිය යටතේ පත් කරනු ලැබූ උප්පැන්න හා මරණ පිළිබඳ රෙජිස්ට්‍රාර් ජනරාල්වරයා ;

(ආ) (112 වන අධිකාරය වූ) විවාහ ලියාපදිංචි කිරීමේ ආඥාපනතේ 2 වන වගන්තිය යටතේ පත් කරනු ලැබූ විවාහ පිළිබඳ රෙජිස්ට්‍රාර් ජනරාල්වරයා ; සහ

(ඇ) (117 වන අධිකාරය වූ) ලේඛන ලියාපදිංචි කිරීමේ ආඥාපනතේ 2 වන වගන්තිය යටතේ පත් කරනු ලැබූ ඉඩම් පිළිබඳ රෙජිස්ට්‍රාර් ජනරාල්වරයා

ඇතුළත් වේ.

ජ 34380—9,980 (78/05)